කාර්යාල නියෝග 11/2021(සංශෝධිත)

මගේ අංකය: RG/AB/01/වක්‍රලේඛ හා කාර්යාල නියෝග පාලන අංශය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.
2021-05-04 වෙනි දින.

අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්
ප්‍රධාන ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන/සිවිල්/නොතාරිස්)
මධ්‍යම ලේඛණාගාරය/ කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

**කොවිඩ්-19 වසංගත තත්ත්වය තදින් පැනිර යාම හේතුවෙන් රා.ප.වක්‍රලේඛ 02/2021(1) අනුව නිකුත් කල දෙපාර්තමේන්තු කාර්යාල නියෝග 10/2021 මඟින් පනවන ලද නියෝග සංශෝධනය කිරීම**

කොවිඩ්-19 වසංගත තත්ත්වය තදින් පැනිර යාම හේතුවෙන් රා.ප.වක්‍රලේඛ 02/2021(1) අනුකූලව නිකුත් කල දෙපාර්තමේන්තු කාර්යාල නියෝග 10/2021 හා ඒ සම්බන්ධයෙන් කටයුතු කලයුතු ආකාරය පිළිබඳව ම ' විසින් නිකුත් කල අංක:RG/01/පොදු/2021 හා 2021-04-29 දිනැති ලිපිය හා බැඳේ

02. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල සියළුම එක්දින සේවාවන් හා සියළුම සාමාන්‍ය සේවාවන් 2021-05-05 දින සිට 2021-05-13 දින දක්වා තාවකාලිකව නවතන අතර, එම කාලසීමාව තුල මහජන සේවා වසා තැබිය යුතුවේ. මේ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට පියවර ගත යුතු අතර, එම කාල පරාසයේදී මෙතෙක් ඒකරාශීවී ඇති වැඩ කොටස් නිමකර ගැනීමට කටයුතු කළයුතුය.

03. එහෙත්, අත්‍යාවශ්‍ය රාජකාරියක් වේනම් නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් හැකි සෑම අවස්ථාවකදීම මහජන සේවය ඉටු කිරීමට වගබලාගත යුතුය.

04 සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද තරයේ අනුගමනය කළයුතු අතර, තමාට පැවරෙන මුර ක්‍රමය අනුව සේවයට වාර්තා කලයුතු අතර, හදිසි රාජකාරි අවශ්‍යතාවලදී දැනුම්දීම මත ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි කටයුතු කලයුතු ය.

05. ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවයේ නිරත නිලධාරීන් දිසාපති/ප්‍රාදේශිය ලේකම්ගේ අභිමතය පරිදි දෙපාර්තමේන්තු නියෝග සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සේවයට වාර්තා කල යුතුය.

06. හදිසි අවශ්‍යතාවයකදී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ මා දැනුවත් කළයුතු අතර, 10/2021 කාර්යාල නියෝගයේ අනෙකුත් විධි-විධාන ඵලෙසම ක්‍රියාත්මක බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
ඉල.394/ඒ 3, චෙන්සිල් කොඩිබැකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

පිටපත:

- ලේකම් - රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
- ලේකම් - ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
- සියළුම දිස්ත්‍රික් ලේකම්වරු/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරු
- රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ
  ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල මහතා